# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 16 දරන
# එක්සත් මුස්ලිම් සංගමය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අප්‍රේල් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 16 දරන එක්සත් මුස්ලිම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 29 වන දින]

එල්.ඩී.—ඕ. 93/80

## එක්සත් මුස්ලිම් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

"එක්සත් මුස්ලිම් සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඉස්ලාමීය ප්‍රතිපත්තිවලට අනුකූලව, එහි සාමාජිකයන් අතරේ සහසුරුවම්කම ප්‍රවර්ධනය කිරීමේ සහ ඒ සාමාජිකයන්ට ණය දීමේ මාර්ගයෙන් ආර්ථික ආධාර ලබා දීමේ පරමාර්ථය සඳහා මුස්ලිම් ජනතාව අතරේ මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද:

එකී එක්සත් මුස්ලිම් සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ඉටු කරනු ලැබ සහ ක්‍රියාත්මක කරනු ලැබ තිබෙන හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලැබ ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 1983 අංක 16 දරන එක්සත් මුස්ලිම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*එක්සත් මුස්ලිම් සංගමය සංස්ථාගත කිරීම.*

**2.** මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු, එක්සත් මුස්ලිම් සංගමයේ තත් කාලයේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) "එක්සත් මුස්ලිම් සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබාගෙන පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව, එකී නාමයෙන් එය විසින් සියලු අධිකරණවල නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

*සංගමයේ පොදු පරමාර්ථ.*

**3.** සංගමයේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනික, සමාජයීය සහ ආර්ථික ප්‍රගතිය සහ උන්නතිය අරභයා සහ පොදුවේ, මුස්ලිම් වර්ගයාගේ දියුණුව සඳහා මුස්ලිම් ජනතාව අතර සාමූහික වැඩ කටයුතු වැඩි දියුණු කිරීම සහ ඒ පරමාර්ථ සඳහා, ශ්‍රී ලංකාව පුරා සංගමයේ ශාඛා පිහිටුවීමෙන්, සංගමයේ කටයුතු පෘථුල කිරීම;

(ආ) පොදුවේ මුස්ලිම් ජනතාව අතර සහ විශේෂයෙන් සංගමයේ සාමාජිකයන් අතර සහසුරුවම්කම හා ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීම;

(ඇ) ඉස්ලාමීය ප්‍රතිපත්තිවලට අනුකූලව, එහි සාමාජිකයන්ට ණය දීම සහ ඔවුන්ට ප්‍රතිලාභ සැලසීම;

(ඈ) ශ්‍රී ලංකාවේ ආගමික සහ ජාතික මිත්‍රත්වය නංවාලීම;

ජ 52183—8,000 (80/10)

(ඉ) මුස්ලිම් ජනතාවගේ පොදු අභිවෘද්ධිය පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි ලා නංවාලීමට පියවර ගැනීම:—

(i) කෘෂිකාර්මික ව්‍යවසායන් ;

(ii) ගෘහ කර්මාන්ත ;

(iii) ගෘහ කර්මය, මාතෘ කර්මය හා සමාජ සෞඛ්‍යය ;

(iv) සමුපකාර ව්‍යවසායන් ;

(v) වාණිජ්‍යය ;

(vi) සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල් අතර සේවා නියුක්තින් සහ පොදු සුභසාධනය ; සහ

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික හෝ උපස්ථම්භක වන වෙනත් ක්‍රියාකාරකම්වල නිරත වීම.

මධ්‍යම සමිති සම්මේලනය.

4. (1) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත මධ්‍යම සමිති සම්මේලනයක් තිබිය යුතු ය :—

(අ) සෑම ශාඛාවක ම සභාපතිවරයා ;

(ආ) එක් එක් ශාඛාව නියෝජනය කෙරෙන පරිදි, සෑම ශාඛාවකින් සාමාජිකයන් තිදෙනා බැගින්.

(2) මධ්‍යම සමිති සම්මේලනය උපදේශක මණ්ඩලයක් ලෙස ක්‍රියා කළ යුතු අතර ඒ සම්මේලනය විසින් මධ්‍යම සභාවේ සාමාජිකයන් තෝරා පත් කළ යුතු ය.

මධ්‍යම සභාව විසින් කටයුතු පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

5. (1) මේ පනතට සහ සංගමයේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව, සංගමයේ මුදල් වියදම් කිරීමේ සහ සංගමයේ නමින් වූ චංචල සහ නිශ්චල දේපළ පිළිබඳව කටයුතු කිරීමේ බලය ද ඇතුළුව, සංගමයේ කටයුතු පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම නිලධාරීන්ගෙන් සහ ඒ රීතිවල විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි වූ සහ ඒ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ නම් කරනු ලබන වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත මධ්‍යම සභාවක් විසින් කළ යුතු ය.

(2) මේ පනත යටතේ වූ මධ්‍යම සභාවේ ප්‍රථම සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී ධුර දරන සංගමයේ මධ්‍යම සභාවේ සාමාජිකයන් විය යුතු ය. තවද, සංගමයේ රීතිවල කුමක් සඳහන් වුව ද, ඒ සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින පටන් එක් අවුරුද්දක් වූ කාලයක් දීගටම ධුර දැරිය යුතු ය. ඒ කෙසේ වෙතත් ඒ සභාව, අනුප්‍රාප්තික මධ්‍යම සභාව මේ පනතේ විධිවිධාන යටතේ විධිමත් ලෙස සංස්ථාපනය කරනු ලබන තෙක් නියත වශයෙන් ම ධුර දැරිය යුතු ය :

එසේ වුව ද, සංගමයේ ජාතික සභාපතිවරයා වූ අයි. එම්. මුසින් මරික්කාර් මහතා, කලින් ධුරයෙන් අස්වන්නේ නම් මිස, ඔහුගේ ජීවිත කාලය තුළ ම සංගමයේ ජාතික සභාපතිවරයා වශයෙන් ද මධ්‍යම සමිති සම්මේලනයේ සාමාජිකයකු වශයෙන් සහ මධ්‍යම සභාවේ සාමාජිකයකු වශයෙන් ද දිගටම ධුර දැරිය යුතු ය.

සංගමයේ රීති.

6. (1) යම් සභා රැස්වීමක දී, එකී රැස්වීමට පැමිණ, ඡන්දය දෙන සාමාජිකයන් අතුරෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් මධ්‍යම සභාව විසින් කලින් කල රීති සාදනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය:—

(අ) සංගමයේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන් සාමාජිකත්වයෙන් ඉවත් වීම සහ නෙරපීම;

(ආ) මධ්‍යම සභාවේ සහ මධ්‍යම සමිති සම්මේලනයේ සාමාජිකයන් සහ සංගමයේ ශාඛාවල නිලධරයන් තෝරා පත් කිරීම, පත් කිරීම හා ඉවත් කිරීම සහ ඔවුන්ගේ ධුර කාලය;

(ඇ) මධ්‍යම සභාවේ, මධ්‍යම සමිති සම්මේලනයේ සහ විවිධ අනුකාරක සභාවල සහ ඒවායේ නිලධරයන්ගේ හා නියෝජිතයන්ගේ කාර්ය;

(ඈ) රැස්වීම් කටයුතු පැවැත්වීමේ දී, විශේෂයෙන් ම මුදල් එකතු කිරීමේ දී, වැය කිරීමේ දී සහ බැහැර කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඉ) සංගමයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම.

(2) මධ්‍යම සභාව විසින් සාදන ලද යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක ආකාරයෙන්ම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය.

(3) සංගමයේ සාමාජිකයන් සංගමයේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයේ ශාඛා.

7. (1) සංගමයේ ශාඛාවක කටයුතු, ශාඛාවේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව තෝරා පත් කළ යුතු නිලධරයන්ගෙන් සහ සෙසු තැනැත්තන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) ශාඛාවක කටයුතු පරිපාලනය කිරීමේ දී, එහි විධායක කාරක සභාව සෑම විට ම, මධ්‍යම සභාවේ විධානවලට සහ පාලනයට යටත් විය යුතු ය.

(3) යම් ශාඛාවක කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම පිණිස, මේ පනතේ විධිවිධානවලට සහ මේ සංගමයේ රීතිවලට අනනුකූල නොවන, අතුරු ව්‍යවස්ථා ඒ ශාඛාව විසින් කලින් කල එහි යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දවලින් සාදනු ලැබිය හැකි ය. ඒ අතුරු ව්‍යවස්ථා මධ්‍යම ශාඛාව විසින් අනුමත

කරනු ලැබූ විට පමණක්, ක්‍රියාත්මක විය යුතු ය. ඒ අතුරු ව්‍යවස්ථා එසේ සාදනු ලැබීමෙන් පසු, එවැනි ම අනුමතය ඇතිව සහ ඒ ආකාරයෙන් ම, ඒවා සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

දේපළ ආදිය දැරීමට සහ ඒ පිළිබඳව කටයුතු කිරීමට ඇති බලය.

8. (1) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියෝදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංගමය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක අයිතිය, සංගමයේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, භාරගැනීමට සහ දැරීමට සංගමයට නීතියේ ලා හැකියාව තිබිය යුතු අතර එකී සියලු දේපළවල අයිතිය, මේ පනතේ කාර්යය සඳහා සංගමය විසින් දැරිය යුතු ය.

(2) සංගමය සතු වූ හෝ සංගමය විසින් අත් කර ගනු ලැබූ හෝ අයිතිය දරන යම් ඉඩමක සංගමය විසින් යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය හැකි අතර සංගමය සතු වූ යම් දේපළක් සංගමය විසින් කලින් කල විකිණීම, ප්‍රදානය කිරීම, සමර්පනය කිරීම, උරුම කර දීම, පැවරීම, හුවමාරු කිරීම සහ නියෝදනය කිරීම කරනු ලැබිය හැකි ය.

සංගමයේ මුද්‍රාව.

9. ජාතික සභාපතිවරයා හෝ ජාතික මහා ලේකම්වරයා හෝ ජාතික භාණ්ඩාගාරිකවරයා සහ මධ්‍යම සභාවේ වෙනත් සාමාජික යන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංගමයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයට තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

අරමුණු සහ ප්‍රතිපත්ති ආදිය පිළිබඳ උද්ගත වන ආරවුල් නිරාකරණය කිරීම.

10. මේ පනතේ හෝ එය යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන යම් රීතියක මේ සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා තිබෙන පරිදි හැර, සංගමයේ අරමුණු සහ ප්‍රතිපත්තිවලට බලපාන හෝ ඊට අදාළ යම් කරුණක් පිළිබඳව පැන නැගෙන යම් ආරවුලක් හෝ සැකයක් හෝ යම් ප්‍රශ්නයක් මධ්‍යම සභාවට යොමු කරනු ලැබිය යුතු අතර ඒ පිළිබඳව ඒ සභාවේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණි දායක මුදල් භාරගනු ලැබේ.